**කින්නියා නගර සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජුනි 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 සැප්තැම්බර් 09 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කින්නියා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අයිතමයන් 78 ක් රු.40,920 කට විකුණා තිබූ අතර එහි විකුණුම් වටිනාකම පමණක් ගිණුම්වල අඩුකර දක්වා තිබුණි. | භාණ්ඩය පදනම් කරමින් එහි වටිනාකම අඩුකර දැක්වීමට කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය ප්‍රකාරව විකුණනු ලැබූ රු.40,920ක් වටිනා අයිතමයන් වැරදීමකින් අදාල වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. අදාල වත්කම් ගිණුම්වලින් ඉවත් කරනු ලබන බව දන්වා සිටිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ නිෂ්චිත වෙන්කළ පළාත් සභා අරමුදලින් නගර සැලසුම් සහ ජල සම්පාදන හා මලාපවහන අමාත්‍යාත්‍යාංශයේ ප්‍රතිපාදනයෙන් ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 05ක් සඳහා පිළිවෙලින් රු.3,440,215ක්, රු.12,892,866ක් සහ රු.4,582,732ක ගෙවීම් බිල්පත් අදාල අමාත්‍යාංශවලට යවා එම ස්ථානයෙන් අදාල මුදල් ලැබී නියමිත කොන්ත්‍රාත්කරුවන්ට ලබාදිය යුතුව තිබුණත් ලැබිය යුතු හා ගෙවිය යුතු වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කළ යුතුවේ. | මේ පිළිබඳව ඊළඟ අවසන් ගිණුම්වල ක්‍රියාත්මක කරනු ලබන බව දන්වා සිටිමි. |

(ආ) **අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවිනිශ්චිත ගිණුමෙහි බැර ශේෂයරු.29,358,517 හඳුනාගෙන කපාහැරිමට කටයුතු නොකර සම්පූර්ණ වටිනාකමම සමුච්චිත අරමුදලෙන් කපා හැර තිබුණි. | ගිණුම් ශේෂය නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරිමට කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයේ නිරවුල් කළ අවිනිශ්චිත ගිණුම සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් කමිටුවක් ස්ථාපිත කර කටයුතු කිරීමට තීරණය කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

(ඇ) **විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.145,375,012 ක්වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ප්‍රමාණවත් සාක්ෂි ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | සාක්ෂි සඳහා ලේඛන සකස් කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

**1.4 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | මුදල් රෙගුලාසි 396 | මාස 06කට පෙර ලබාදුන් නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ එකතුව රු.147,500ක චෙක්පත් 11ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මාස 06ක් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් සභාවට ඉදිරිපත් කර සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා සිටිමි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02ක් ඉක්මවූ රු.6,713,385ක ලංසු තැන්පතු | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු | වර්ෂ 02ක් ඉක්මවූලංසු තැන්පතු නියමිත ක්‍රියාමාර්ග |

| | | | | |
|---|---|---|---|---|
| | | මුදල් රෙගුලාසි අනුව ගෙවා නිරවුල් කිරීමට හෝ ආදායමට මාරු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කළ යුතුවේ. | ගනු ලැබූ අතර ආදායමට මාරු කිරීමට කටයුතු කරඇති බව දන්වා සිටිමි. |
| (iii) | මුදල් රෙගුලාසි 880 | මුදල්, ගඩඩා අයිතමයන් සහ චෙක්පත්වල අත්සන් කිරීම ආදිය නිලධාරීන් 04දෙනෙකුට පරිපාලනමය වශයෙන් පවරනු ලැබුවත්, ඔවුන්ගෙන් අයවිය යුතු ආරක්ෂිත ඇප මුදලේ ප්‍රමාණය තීරණය නොකළ බැවින් ඇප මුදල් ලැබී නොතිබුණි. | අදාල නිලධාරියාගෙන් ඇප මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | ආරක්ෂිත ඇප මුදල් අයකිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරීන් සමග සාකච්ඡා කර තීරණය කිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,468,883 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,171,996 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 2,300 | 389 | 274 | 1,629 | 2,000 | 752 | 83 | 2,299 |
| කුලී | 500 | 13,107 | 11,284 | 12,307 | 11,500 | 8,718 | 9,536 | 11,529 |
| එකතුව | 2,800 | 13,496 | 11,558 | 13,936 | 13,500 | 9,470 | 9,619 | 13,828 |

### 2.2.2 වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයට අයත් ස්ථානවල පවතින ඉඩම් සහ ඉදිකළ නිවාස, ගොඩනැගිලි ආදිය මත 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා | හිඟහිටි මුදල් අයකිරීමට කටයුතු කළ යුතුවේ. | පසුගිය වර්ෂය හා සැසඳීමේදි වරිපනම් බදු ආදායම් වැඩියෙන් අයකිරීමට කටයුතු කර ඇති අතර හිඟහිටි වරිපනම් බදු ආදායම් |

| | | | |
|---|---|---|---|
| | හිඟහිටිව පවතින වරිපනම් බදු එකතුව රු.1,628,639ක් අයකර නොතිබුණි. | | අයකිරීමට අදාල නිලධාරියා මාර්ගයෙන් කටයුතු කර ඇති බව දන්වා සිටිමි. |
| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| 2.2.3 | **මාළු වෙළෙඳපොල බදුකුලි** | | |
| | 2008 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා මාළු වෙළෙඳපොල හිඟ බදු කුලි රු.7,431,250ක් අයකිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | හිඟහිටි බදු කුලි අයකිරීමට කටයුතු කළ යුතුවේ. | මාළු වෙළෙඳපොල හිඟ බදු කුලි සම්බන්ධයෙන් 2011 සහ 2013 වර්ෂ වෙනුවෙන් නඩු විභාග වෙමින් පවතින අතර අනෙකුත් වර්ෂවල හිඟ හිටි සඳහා සභාවේ නීතිඥවරයා මාර්ගයෙන් Letter of Demand නිකුත් කර ඇති අතර 2019 වර්ෂයටද නිකුත් කිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි. |
| 2.2.4 | **මස්කඩ බදුකුලි** | | |
| | 2007 සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා මස්කඩ හිඟ බදු කුලි රු.2,776,726ක් අයකිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | හිඟහිටි බදු කුලි අයකිරීමට කටයුතු කළ යුතුවේ. | 2007 වර්ෂයේ සිට මේ දක්වාමස්කඩ හිඟ බදු කුලි සඳහා Letter of Demand නිකුත් කර ඇත.ඇතැම් මස්කඩවලට සමථ මණ්ඩලයේ නඩු පැවරීමෙන් හිඟ ආදායම් අයකර ඇති බව දන්වන අතර අනෙකුත් හිඟ මුදල්වලට එරෙහිව නීතිමය පියවර ගැනීමට තීරණය කර ඇත. |
| 2.2.5 | **කුකුළු මස්කඩබදුකුලි සහ කරවල කඩ බදුකුලි** | | |
| | 2017 සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා කුකුළු මස්කඩ සහ කරවල කඩ හිඟ බදු කුලි පිළිවෙලින් රු.1,516,683ක් සහ රු.244,010ක් අයකිරීමට සභාව මේ දක්වා කටයුතු කර නොතිබුණි. | හිඟහිටි බදු කුලි අයකිරීමට කටයුතු කළ යුතුවේ. | 2017, 2018 වර්ෂවල කුකුළු මස්කඩ බදුකුලි කරුටඑරෙහිව නඩු විභාග වෙමින් පවතින අතර අනෙකුත් කුකුළු මස් කඩ හා කරවල කඩ බදුකුලිකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට තීරණය කර ඇති බව දන්වා සිටිමි. |
| 2.2.6 | **සතිපොළ, එළවළු වෙළෙඳපොල සහ ආපනශාලා බදුකුලි** | | |
| | 2009 වර්ෂය සඳහා සතිපොළ හිඟබදුකුලි රු.220,055, 2017 වර්ෂයට අදාල එළවළු වෙළෙඳපොල හිඟකුලි රු.16,300, 2018 සහ 2019 වර්ෂ වෙනුවෙන් ආපනශාලා හිඟකුලි රු.101,875ක් අයකිරීමට සභාව මේ දක්වා කටයුතු කර නොතිබුණි. | හිඟහිටි බදු කුලි අයකිරීමට කටයුතු කළ යුතුවේ. | සතිපොළ, එළවළු වෙළෙඳපොල සහ ආපනශාලා හිඟහිටි බදුකුලි සම්බන්ධයෙන් සමථ මණ්ඩලයේ නඩු පවරා දැනට අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇති බව දන්වා සිටිමි. |

## 2.2.7 උසාවි දඩ ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ උසාවි දඩ ගාස්තු සම්පූර්ණයෙන්ම ලබාගැනීමට විගණන දිනය වන 2020 ජූලි 02 දින වන විටත් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට 2020 ජනවාරි දක්වා රු.5,580,899 ක් ගණනය කර ඇති බව දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **පාරිසරික ගැටළු** | | |
| සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශයක් වන කරෙයිච්චි මාර්ගය අසල පවතින ගංභාශ්‍රිතව, ප්‍රදේශයේ ජනතාව විසින් කසළ බැහැර කිරීමේ හේතුවෙන් ගඟ අසබඩප්‍රදේශය දූෂණයට ලක්වී තිබුණි. මේ පිළිබඳ පසුගිය වර්ෂයේ වාර්තාවේද සඳහන් කර තිබූ නමුත් මේ දක්වා සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පරිසරය පිරිසිදුව තැබීමට කටයුතු කළ යුතුවේ. | ගංභාශ්‍රිතව කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් පොලීසිය සමග එක්ව නගර සභාව විසින්ක්‍රියාමාර්ග ගෙන ඇති අතර තැනින් තැන කසල බැහැර කිරීම තහනම් කර ඇත. දැන්වීම් පුවරු සවි කර ඇති බවද ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. |

### 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍යායතනයේ මූල්‍යාධාර මත 2008 වර්ෂයේදී සභාවට පරිත්‍යාග කළ මහන මැෂින් 22 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ ක්‍රියා විරහිතව තිබුණි. ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් නිසි අයුරින් භාවිතා කිරීමට කටයුතු කළ යුතුවේ. | මහන මැෂින් 22න් අලුත්වැඩියා කළ යුතු ඒවා හඳුනාගෙන අලුත්වැඩියා කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ගණකාධිකාරී තනතුර පසුගිය වසර 08 ක් පුරාම පුරප්පාඩුව පැවති නමුත් එය පිරවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. | සභාව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් කිහිප අවස්ථාවකදීම ඉල්ලීම් කර තිබුණත් මේ දක්වා පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 වර්ෂයේදී සභා බලප්‍රදේශයේ කොට්ඨාශ 7 ක් සඳහා වූ දේපළ බදු තක්සේරු වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සභාවට ලබාදී තිබුණි. එසේ වුවද, 1999 වර්ෂයේදී සිදුකළ තක්සේරුව පදනම් කරමින්ම වරිපනම් බදු අය කරමින් පැවතුණි. | 2012 වර්ෂය පදනම් කරමින් බදු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | 2012 වර්ෂයේදී දේපළ බදු කොට්ඨාශ 7 ක් සඳහා තක්සේරු කරන ලද නමුත් ඉන් ඇතැම් කොට්ඨාශවලට අදාල වරිපනම් බදු තක්සේරු ආකෘතීන් පිළිබඳ ඉල්ලීම් සිදු කළද, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් නොකිරීම නිසා ක්‍රියාත්මක කළ නොහැකි විය. එනමුත්, 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.5 මතභේදාත්මක ස්වරූපයේ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ලේකම්වරයා සහ පරිපාලන නිලධාරී යන අයට ලබාදුන් එකතුව රු.127,443 ක දීමනා ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් තහවුරු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කාර්යයන් සිදුවීම තහවුරු කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම අඩුපාඩුව ඉදිරි කාලයේදී සිදු නොවන බවට තහවුරු කරමු. |

## 3.6 වත්කම් කළමනාකරණය

### 3.6.1 අයිතිය මාරු නොකළ වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වෙනත් ආයතන විසින් සභාවට පරිත්‍යාග කළ වාහන 07 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ නමට වාහනවල අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතුවේ. | වාහනවලට අදාල අයිතිය පැවරීම සම්බන්ධයෙන් Department of Motor Traffic ඇල්විටිගල මාවත, කොළඹ යන ස්ථානයට මාරු කරන ලෙසට ඉල්ලීම් කර යවා ඇත. තවද මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |

### 3.6.2 නිෂ්කාර්යව පවතින වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ ඇති මහේන්ද්‍රා කැබ් වර්ගයේ ට්‍රැක්ටරය සහ යතුරු පැදිය වර්ෂ 05 සිට 07කට අධික කාලයක සිට අලුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවතුණි. | අලුත්වැඩියාකිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම වත්කම් ඉවත්කිරීමේ ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදුවෙමින් පවතින බව දන්වා සිටිමි. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කරීමට කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණනයකළමනාකරණ කමිටුවක් පත්කර ඇත. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක DMA/01-2019හි 5.3 වගන්තිය ප්‍රකාරව, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු බව සඳහන් වුවත්, සභාව විසින් කිසිදු රැස්වීමක් සමාලෝචිත වර්ෂයේ පවත්වා නොතිබුණි. | කාර්තුවකට වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදි කාර්තුව සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |